සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

21	S	I

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

Third Term Test - Grade 12 - 2019

විභාග අංකය ..... ආර්ථික විද්‍යාව I කාලය පැය දෙකයි

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න. (පිළිතුරු සැපයීම සඳහා බහුවරණ කඩදාසියක් සපයනු ලැබේ)**

01. සාර්ව ආර්ථික සංකල්පයකට උදාහරණයකි.
1. හිඟකම
2. නිෂ්පාදන කාර්යක්ෂමතාවය
3. තෝරාගැනීම
4. ආර්ථික පසුබැසීම
5. ආර්ථික කාර්යක්ෂමතාව

02. ආර්ථික භාණ්ඩ හා ආර්ථික නොවන භාණ්ඩ අතරින් ආර්ථික නොවන භාණ්ඩ වල පමණක් දක්නට ලැබෙන ලක්ෂණය වන්නේ,
1. ආර්ථිකයට සැපයීම සඳහා හිඟසම්පත් උපයෝජනය නොකරයි.
2. පරිභෝජනයේදී ධන ආවස්ථික පිරිවැයක් හටගනී.
3. පරිභෝජනයේදී උපයෝගිතාවක් ලබාදෙයි.
4. මිනිස් වුවමනාවක් සපුරාලයි.
5. වුවමනාවන්ට සාපේක්ෂව හිඟකමකින් යුක්ත වේ.

03. ප්‍රාග්ධන භාණ්ඩ, පාරිභෝගික භාණ්ඩ වලින් වෙන්කර දැක්විය හැකි සුවිශේෂ වූ ලක්ෂණය වන්නේ ප්‍රාග්ධන භාණ්ඩ,
1. කල්පවත්නා භාණ්ඩයක් වීම යි.
2. නිෂ්පාදනය කරන ලද භාණ්ඩයක් වීමයි.
3. වෙනත් භාණ්ඩයක් නිපදවීමට ආධාර වන නිෂ්පාදිතයක් වීමයි
4. සාපේක්ෂ වශයෙන් හිඟකමකින් යුක්ත වීමයි.
5. සම්පත් පිරිවැයක් සහිත නිෂ්පාදිතයක් වීමයි.

04. හිඟකම පිළිබඳ ප්‍රශ්නය සෑම ආර්ථිකයකම දක්නට ලැබෙන්නේ,
1. පවත්නා සම්පත් කාර්යක්ෂමව උපයෝජනය නොකරන බැවිනි.
2. සමාජීය වශයෙන් ප්‍රශස්ත මට්ටමට වඩා වැඩියෙන් නිපදවන බැවිනි.
3. මිනිසුන්ගේ ආදායම් ව්‍යාප්ති විෂමතාව ඉහළ මට්ටමක පවතින බැවිනි.
4. පවත්නා සම්පත් වුවමනා සපුරාලීමට ප්‍රමාණවත් නොවන බැවිනි.
5. ප්‍රමාණවත් ආර්ථික වර්ධනයක් අත්කර ගැනීමට අපොහොසත් වන බැවිනි.

05. වෙළෙඳපොල ආර්ථිකයක මිල ගණන් විසින් ඉටු කරනු ලබන කාර්යයකි.
1. හිඟ සම්පත් විවිධ අංශ අතර බෙදා වෙන් කිරීම.
2. ආර්ථික ස්ථායිතාව තහවුරු කිරීම
3. ආදායම් ව්‍යාප්ති විෂමතා ඉවත් කිරීම.
4. මිල ගණන් පහළ යාමට සැලැස්වීමෙන් අධි ඉල්ලුම ඉවත් කිරීම.
5. මිල ගණන් පහළ යාමට සැලැස්වීමෙන් නිෂ්පාදන ආයතන ධෛර්යයමත් කිරීම.

06. මධ්‍යගත සැලසුම් අධිකාරියක් විසින් දෙනු ලබන නියෝග මත මූලික ආර්ථික ප්‍රශ්න විසඳනු ලබන ආර්ථික පද්ධතිය.
1. වෙළෙඳපොළ ආර්ථික පද්ධතියයි
2. විධානගත ආර්ථික පද්ධතියයි.
3. සමාජවාදී වෙළෙඳපොළ ආර්ථික පද්ධතියයි.
4. සමාජවාදී ආර්ථික පද්ධතියයි.
5. මිශ්‍ර ආර්ථික පද්ධතියයි.

07. ආහාර හා රෙදිපිළි යන භාණ්ඩ දෙවර්ගයම නිපදවමින් නිෂ්පාදනය හැකියා මායිම් වක්‍රය මත ලක්ෂ්‍යයක කටයුතු කරන කිසියම් ආර්ථිකයක නිෂ්පාදනය කරනු ලබන ආහාර ප්‍රමාණය වැඩිකළ විට,
1. ආහාර නිෂ්පාදන අංශයෙන් පමණක් නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය දකුණට විතැන් වේ.
2. ආහාර නිෂ්පාදනයේ ආවස්ථික පිරිවැය වැඩිවේ.
3. ආහාර නිෂ්පාදනයේ ආවස්ථික පිරිවැය අඩුවේ.
4. රෙදිපිළි නිෂ්පාදන අංශයෙන් හැකියා වක්‍රය වමට විතැන්වේ.
5. රෙදිපිළි නිෂ්පාදනයේ පහළ වැටීමක් සිදුවේ.

08. කාලයත් සමඟ කිසියම් රටක නිෂ්පාදන හැකියා වක්‍රයේ විතැන් වීම පහත රූප සටහන පෙන්නුම් කරයි.



මෙම ආර්ථිකයේ නිෂ්පාදන සංයෝගය A සිට B ලක්ෂය වෙත මාරුවීම සඳහා හේතුවිය හැකි සාධකය කුමක්ද?
1. පවතින සියලු සම්පත් උපරිම කාර්යක්ෂමතාවන් උපයෝජනය කිරීම
2. ආර්ථිකයේ කාර්යක්ෂමතාව ඉහළ නංවා ගැනීම.
3. ජනගහනයේ අධ්‍යාපන මට්ටම ඉහළ යාම.
4. සේවා නියුක්තිය ඉහළ යාම
5. පූර්ණ වශයෙන් සමාජය සතු සම්පත් උපයෝජනය කිරීම.

09. කිසියම් ආර්ථිකයක් වර්තමානයේදී සම්පත් සාපේක්ෂ වැඩි ප්‍රමාණයක් ප්‍රාග්ධන භාණ්ඩ නිපදවීම සඳහා උපයෝජනය කරයි නම් එම ආර්ථිකයේ,
1. අනාගත විභව නිමැවුම විශාල වශයෙන් වර්ධනය වනු ඇත.
2. අනාගත ජීවන තත්ත්වය පහළ යනු ඇත.
3. ප්‍රාග්ධන භාණ්ඩ නිෂ්පාදනයේ ආවස්ථික පිරිවැය ශූන්‍ය වනු ඇත.
4. ආර්ථික වෘද්ධිය මන්දගාමී වනු ඇත.
5. වර්තමාන පරිභෝජන මට්ටම ඉහළ යනු ඇත.

10. X භාණ්ඩයේ මිල අඩු වූ විට ආදේශන ප්‍රතිවිපාකය -20 ක් වූ අතර ආදායම් ප්‍රතිවිපාකය -100 ක් වූයේ නම්, X භාණ්ඩය,
1. ආදේශන භාණ්ඩයකි.
2. ගිෆන් භාණ්ඩයකි.
3. බාල භාණ්ඩයකි.
4. සාමාන්‍ය භාණ්ඩයකි
5. අනුපූරක භාණ්ඩයකි.

11. එක්තරා වෙළඳපලක X,Y,Z ලෙස භාණ්ඩ වර්ග තුනක් Qd = 300 - 15P ලෙස සමාන වූ ඉල්ලුම් ශ්‍රිතයන්ගෙන් සමන්විතවන විටෙක, වෙළඳපල ඉල්ලුම් ශ්‍රිතය වන්නේ,
1. Qd = 300-5P
2. Qd = 100-5P
3. Qd = 200-10P
4. Qd = 900-45P
5. Qd = 600 -30P

12. සිනමා ශාලාවක පවතින මුළු ආසන සංඛ්‍යාව 1000 ක් වන අතර, සිනමා දර්ශනයක් සඳහා වන ටිකට් පත්වල ඉල්ලුම් ශ්‍රිතය Qd = 25000-400 P වන විට, ටිකට් පතක සමතුලිත මිල වනුයේ,
1. රු. 60.00
2. රු. 25.00
3. රු. 400.00
4. රු. 600.00
5. රු. 1000.00

13. භාණ්ඩයක් සඳහා පවතින සැපයුම අඩුවීම සඳහා බලපාන හේතුවක් **නොවන්නේ,**
    1. යල්පැන ගිය තාක්ෂණය භාවිතය.
    2. රජය නිෂ්පාදකයාගෙන් අයකරන බදු වැඩි කිරීම.
    3. රජය නිෂ්පාදකයා වෙත ලබාදෙන සහනාධාර වැඩිකිරීම.
    4. අනාගතයේ සලකා බලන භාණ්ඩයේ මිල වැඩි වෙතැයි නිෂ්පාදකයා අපේක්ෂා කිරීම.
    5. නිෂ්පාදකයා යොදාගන්නා යෙදවුම්වල මිල වැඩිවීම.

14. X භාණ්ඩයේ මිල රු. 100 සිට රු. 80.00 දක්වා අඩුවීම නිසා Y භාණ්ඩය සඳහා ඇති ඉල්ලුම් ප්‍රමාණය ඒකක 1500 සිට 2000 දක්වා වැඩිවේ. ඒ අනුව X හා Y භාණ්ඩ විය හැක්කේ,
    1. තේ හා කෝපි
    2. ජංගම දුරකථන හා සිම් කාඩ්
    3. පෞද්ගලික ප්‍රවාහණ හා පොදු ප්‍රවාහන
    4. පාන් සහ බත්
    5. නැවුම් එළකිරි (Fresh milk) හා පිටිකිරි

15. එක්තරා භාණ්ඩ වෙළඳපලක් සම්බන්ධයෙන් වූ ඉල්ලුම් හා සැපයුම් සමීකරණ පහත පරිදි වේ.

    Qd = 40-P Qs = -10+3P

    ඒකක 11 කදී මෙම වෙළඳපල තුල දක්නට ලැබෙන අධි ඉල්ලුම් මිල හා උපරිම ඉල්ලුම් මිල වන්නේ,

	අධි ඉල්ලුම් මිල (රු.)	**උපරිම ඉල්ලුම් මිල (රු.)**
1	10.00	29.00
2	7.00	40.00
3.	25.00	29.00
4.	5.50	3.30
5.	22.00	40.00

16. සාමාන්‍ය භාණ්ඩයකට අදාළ මිල ඉල්ලුම් නම්‍යතාව හා ආදායම් ඉල්ලුම් නම්‍යතාව වන්නේ,
    1. ඍණ මිල ඉල්ලුම් නම්‍යතාව හා ධන ආදායම් ඉල්ලුම් නම්‍යතාව
    2. ධන මිල ඉල්ලුම් නම්‍යතාවය හා ඍණ ආදායම් ඉල්ලුම් නම්‍යතාව
    3. ධන මිල ඉල්ලුම් නම්‍යතාව හා ධන ආදායම් ඉල්ලුම් නම්‍යතාව
    4. ඍණ මිල ඉල්ලුම් නම්‍යතාව හා ඍණ ආදායම් ඉල්ලුම් නම්‍යතාව
    5. ධන මිල ඉල්ලුම් නම්‍යතාව හා ශූන්‍ය ආදායම් ඉල්ලුම් නම්‍යතාව

17. වමේ සිට දකුණට ඍණ බෑවුමක් සහිත ඉල්ලුම් වක්‍රයක් හා වමේ සිට දකුණට ධන බෑවුමක් සහිත සැපයුම් වක්‍රයක් පවතින එක්තරා භාණ්ඩයක් සඳහා පනවා තිබූ නිෂ්පාදන බදු කපාහැරීමක් නිසා, භාණ්ඩය සඳහා වන,
    1. සමතුලිත මිල වැඩිවේ. සමතුලිත ප්‍රමාණය වැඩිවේ.
    2. සමතුලිත මිල අඩුවේ. සමතුලිත ප්‍රමාණය අඩුවේ.
    3. සමතුලිත මිල වැඩිවේ. සමතුලිත ප්‍රමාණය නොවෙනස්ව පවතී.
    4. සමතුලිත මිල නොවෙනස්ව පවතී. සමතුලිත ප්‍රමාණය වැඩිවේ.
    5. සමතුලිත මිල අඩුවේ. සමතුලිත ප්‍රමාණය වැඩිවේ.

18. Qd = 300- 5P හා Qs = -100+3P ලෙස වෙළඳපල ඉල්ලුම් හා සැපයුම් සමීකරණ ලබාදී ඇති විටෙක, අදාල අධි සැපයුම් සමීකරණය වන්නේ,
    1. Es = 400- 8P
    2. Es = 200 + 2P
    3. Es = -400 + 8P
    4. Es = -100 -3P
    5. Es = -100 + 3P

19. බාල භාණ්ඩයක් සඳහා වන ආදායම් ඉල්ලුම් නම්‍යතාව,
    1. අනම්‍ය වේ.
    2. ධන වේ.
    3. ඍණ වේ.
    4. ශූන්‍ය වේ.
    5. නම්‍ය වේ.

20. ප්‍රමාණ අක්ෂයේ ධන අන්තඃඛණ්ඩයකින් ආරම්භවී ඉහළට ගමන් කරන සැපයුම් වක්‍රයක ඕනෑම ලක්ෂ්‍යක සැපයුමේ මිල නම්‍යතාවය,
    1. පූර්ණ නම්‍ය වේ. මිල වැඩිවීමකදී සැපයුම් නම්‍යතා අගය වැඩිවේ.
    2. එකට අඩු වේ. මිල අඩුවීමකදී සැපයුම් නම්‍යතා අගය අඩු වේ.
    3. එකට වැඩි වේ. මිල අඩු වීමක දීසැපයුම් නම්‍යතා අගය අඩුවේ.
    4. එකට වැඩිවේ. මිල වැඩි වීමකදී සැපයුම් නම්‍යතා අගය අඩුවේ.
    5. එකට අඩු වේ. මිල අඩු වීමකදී සැපයුම් නම්‍යතා අගය වැඩි වේ.

21. සහල් සඳහා වන වෙළඳපල ඉල්ලුම් ශ්‍රිතය හා සැපයුම් ශ්‍රිතය පිළිවෙලින් Qd = 500 – 3P හා Qs = 80+4P යැයි සිතන්න.
වෙළඳපලේ සහල් කිලෝ එකක මිල රු. 50.00 ක් ලෙස රජය විසින් නියම කළහොත් ඇතිවිය හැකි තත්ත්වය වන්නේ,
1. අධිසැපයුම් නිසා මිල ඉහළයාම
2. අධි ඉල්ලුම නිසා මිල පහළ යාම
3. අධි සැපයුම නිසා මිල පහළ යාම
4. අධි ඉල්ලුම නිසා මිල ඉහළ යාම
5. සමතුලිත මිලක් ඇතිවීම

22. මිල ඉල්ලුම් නම්‍යතාව 1 ටඅඩු භාණ්ඩයක් සඳහා වන පාරිභෝගික පැහැදම
1. මිල වැඩි වීමකදී වැඩිවේ.
2. මිල අඩු වීමකදී හෝ වැඩිවීමක දී නොවෙනස්ව පවතී
3. මිල අඩු වීමක දී වැඩි වේ.
4. මිල වැඩිවීමකදී අඩු වේ.
5. මිල අඩු වුවද වැඩි වුවද වැඩි වේ.

23. නිදහස් වෙළඳපල ආර්ථියක් වෙත රජය මැදිහත් වී ඒකක බද්දක් පැනවීමේදී, සමාජ ශුභ සාධනයේ අහිමිවීමක් සිදුනොවන තත්ත්වයක, එම භාණ්ඩයේ මිල ඉල්ලුම් නම්‍යතාව විය යුත්තේ,
1. අනම්‍ය තත්ත්වය
2. පූර්ණ නම්‍ය තත්ත්වය
3. පූර්ණ අනම්‍ය තත්ත්වය
4. නම්‍ය තත්ත්වය
5. ඒකීය නම්‍ය තත්ත්වය

24. නම්‍ය ඉල්ලුමක් හා අනම්‍ය සැපයුමක් පවතින මාගරින් සඳහා ඒකක බද්දක් පැනවීම නිසා,
1. වැඩි බදු බරක් පාරිභෝගිකයාට දැරීමට සිදුවේ.
2. වැඩි බදු බරක් නිෂ්පාදකයාට දැරීමට සිදුවේ.
3. පාරිභෝගිකයාට හා නිෂ්පාදකයාට සමාන බදු බරක් දැරීමට සිදුවේ.
4. මුළු බදු බර පාරිභෝගිකයා දරයි.
5. මුළු බදු බර නිෂ්පාදකයා දරයි.

25. අවම මිල සහතික මිලක් ලෙස සලකමින් නිෂ්පාදකයා ආරක්ෂා කර ගැනීම සඳහා යොදාගන්නා රජයේ මිලදී ගැනීම් සහිත මිල ආධාරක ප්‍රතිපත්තියට අදාළ නිවැරදි වරණය වන්නේ,
1. පාරිභෝගික හා නිෂ්පාදන අතිරික්තයේ අඩුවීමක් සිදුවේ.
2. පාරිභෝගික අතිරික්තය වැඩිවන නමුත් නිෂ්පාදන අතිරික්තයේ අඩු වීමක් සිදුවේ.
3. පාරිභෝගික අතිරික්තය අඩුවන නමුත් නිෂ්පාදන අතිරික්තයේ වැඩි වීමක් සිදුවේ.
4. පාරිභෝගික හා නිෂ්පාදන අතිරික්තයේ වැඩිවීමක් සිදුවේ.
5. පාරිභෝගික අතිරික්තය වෙනස් නොවන නමුත් නිෂ්පාදන අතිරික්තය අඩුවීම සිදුවේ.

26. උපරිම මිල ප්‍රතිපත්තියේ අනිවාර්ය ප්‍රතිවිපාකයක් නොවන්නේ,
1. අධි ඉල්ලුම නිසා වෙළඳපලෙහි භාණ්ඩ හිඟයක් ඇතිවීම.
2. කළුකඩ මිලට භාණ්ඩ අලෙවි කිරීම.
3. නිෂ්පාදන ක්ෂේත්‍රයේ ආයෝජන සීමා වීම
4. නිෂ්පාදන අතිරික්තයට අයහපත් බලපෑමක් ඇතිවීම.
5. සමාජ ශුභ සාධනය අයහපත් වීම.

27.



ප්‍රස්තාර සටහනට අනුව P_2 අවම මිලක් පනවා රජය විසින් ඌණ පූර්ණ ගෙවීමක් සිදු කරන්නේ නම්, නිෂ්පාදකයාගේ ආදායම හා පාරිභෝගික අතිකරීතයේ වෙනස වන්නේ,

	නිෂ්පාදකයාගේ ආදායම	**පාරිබෝගික අතිරික්තයේ වෙනස**
1	B+C+D+E+F+G+H+I+J	D+E+F
2	B+C+D+E+F+G	B+C
3.	H+I+J	B+D+E+F
4.	D+H	H+J+J
5.	D+E+H+J	A+B

28. කිසියම් නිෂ්පාදන ආයතනයක කෙටි කාලයේදී හටගන්නා ආන්තික පිරිවැය පිළිබඳ දත්ත පහත වගුවේ දැක්වේ.

නිමවුම (ඒකක)	**ආන්තික පිරිවැය (රු.)**
1	40
2	30
3	26
4	34
5	50
6	66

නිමවුම ඒකක 2 දී සාමාන්‍ය ස්ථාවර පිරිවැය රු. 15 ක් වේ නම්, නිමැවුම ඒකක 4 දී මුළු පිරිවැය කොපමණ වේද?

1. රු.160 2. රු. 130 3. රු. 64 4. රු. 50 5. රු. 34

29. කෙටි කාලීන නිෂ්පාදන ක්‍රියාවලියේදී ආයතනයක සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රය හා සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රය අතරපවතින සිරස් දුර,

1. නිමවුම අඩුවන විට අඩු වෙමින් පවතී.
2. ආන්තික පිරිවැයට සමාන වේ.
3. මුළු ස්ථාවර පිරිවැයට සමානවේ.
4. නිමවුම වැඩි වන විට අඩුවෙමින් පවතී.
5. නිමවුම වෙනස් වුවද ස්ථාවරව පවතී.

30. රූප සටහනෙහි දැක්වෙන්නේ සියලුම නිෂ්පාදන සාධක වල සේවා නියුක්තිය වැඩි කරන විට ආයතනයේ සාමාන්‍ය මුළු පිරිවැය හැසිරෙන ආකාරයයි.



ආයතනයේ නිමැවුම $0Q_1$ සිට $0Q_2$ දක්වා වැඩිකරන විට,

1. පරිමාණානුකූල නොපිරිමැසුම් හටගනී.
2. යෙදවුම් වැඩි කරන ප්‍රතිශතයට වඩා වැඩි වේගයකින් නිමැවුම වැඩිවේ.
3. යෙදවුම් වැඩි කරන ප්‍රතිශතයට වඩා අඩුවේගයකින් නිමැවුම වැඩිවේ
4. හීනවන ආන්තික ඵල හටගනී.
5. අඩුවන පරිමාණානුකූල ඵල හටගනී.

31. ඒකාධිකාරී තරගය හා ඒකාධිකාරය යන වෙළපොල තත්වයන් දෙකෙහිම දක්නට ලැබෙන ලක්ෂණයකි.

1. දිගු කාලයේ දී නිෂ්ප්‍රමාණික ලාභ ලැබීම
2. ප්‍රවේශයට බාධා පැවැතීම.
3. භාණ්ඩයේ මිල කෙරෙහි බලපෑම් කළ හැකිවීම
4. නිෂ්පාදිතය සුවිශේෂී වූ එකක් වීම
5. ආයතනය හා කර්මාන්තය ඒකිනෙකට අනන්‍ය වීම.

32. පහත රූප සටහනෙහි දැක්වෙන ආකාරයේ පිරිවැය හා ඉල්ලුම් තත්ත්වයකට මුහුණදෙන නිෂ්පාදන ආයතනයකට ලාභ උපරිම කෙරෙන ප්‍රශස්ත නිමැවුම් මට්ටම වන්නේ,



1. Q_1 නිමැවුම් මට්ටමයි
2. Q_2 නිමැවුම් මට්ටමයි
3. Q_3 නිමැවුම් මට්ටමයි
4. Q_4 නිමැවුම් මට්ටමයි
5. Q_5 නිමැවුම් මට්ටමයි

33. කතිපයාධිකාරී වෙළඳපොළ ව්‍යුහය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශයක් නිවැරදි වේද?
1. ආයතනයේ ඉල්ලුම් වක්‍රය පූර්ණ නම්‍ය වේ.
2. අලුත් ආයතන වලට පහසුවෙන් වෙළඳපොලට ප්‍රවේශවිය හැකිය.
3. වෙළඳපොළ තුළ විශාල ආයතන ප්‍රමාණයක් පවතී.
4. ආයතන අතර අන්‍යෝන්‍ය රැඳියාවක් පවතී.
5. ප්‍රචාරණයක් දක්නට නොමැත.

34. වර්තමාන සේවා නියුක්තිය මගින් රු. 50,000 ක මාසික වැටුපක් උපයා ගන්නා කිසියම් පුද්ගලයෙකුට ඊළඟට කළ හැකි රැකියාව තුළින් මාසිකව රු. 45,000 ක් ඉපයීමට හැකිව තිබුණේ යැයි සලකන්න. මෙම තොරතුරු වලට අනුව ඔහුගේ මුළු ඉපයීම තුළ ඇතුළත් ආර්ථික බදු කුලිය කොපමණද?
1. රු. 50,000 2. රු. 45,000 3. රු. 30,000 4. රු. 10,000 5. රු. 5000

35. ශ්‍රම සාධකයේ මුළු ඉපයීම සංක්‍රාම ඉපයුම් වලින් පමණක් සමන්විත වන්නේ ශ්‍රම සාධකයේ නම්‍යතාව,
1. ඒකීය නම්‍ය වන විටදීය
2. නම්‍ය වන විටදීය
3. පූර්ණ අනම්‍ය වන විටදීය
4. පූර්ණ නම්‍ය වන විටදීය
5. අනම්‍ය වන විටදීය

36. ආර්ථික ප්‍රදේශයක් තුළ ක්‍රියාත්මකවන ආයතනික ඒකකයක් නොවන්නේ මින් කුමක්ද?
1. මූල්‍ය නොවන සමාගමික අංශය
2. රාජ්‍ය නොවන සංවිධාන අංශය
3. මූල්‍ය සමාගමික අංශය
4. ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවා සපයන අංශය
5. කුටුම්භ අංශය

37. කිසියම් වර්ෂයක් තුළ සිදු වූ පහත දැක්වෙන එක් එක් ක්‍රියාවලින්, දළ දේශීය නිෂ්පාදිතයට ඇතුළත් කරන්නේ කුමක් ද ?
1. ජලාශයක මත්ස්‍යන් එක්තරා වසරකදී 10% කින් ස්වභාවිකව වර්ධනය වීම
2. පුද්ගලයෙක් වෙන්දේසියකින් පුරා විද්‍යාත්මක වටිනාකමකින් යුත් භාණ්ඩයක් මිලදී ගැනීම
3. එක්තරා ගොවියෙක් තම පරිභෝජනයට වගාකරගත් එළවළු
4. පුත්ගලයෙකු තම නිවස තමා විසින්ම පිරිසිදු කර ගැනීම.
5. පුද්ගලයෙකු විසින් මිලදීගත් ඉඩමක වටිනාකම එක්තරා වසරකදී මිලියන 5 කින් වැඩිවීම.

38. යම් කාල පරිච්ඡේදයක් තුළ කිසියම් භූගෝලීය ප්‍රදේශයක සියලු නිෂ්පාදන කටයුතුවල එකතුකළ අගයේ එකතුව හැඳින්වෙන්නේ,
1. දළ ජාතික නිෂ්පාදිතය
2. දළ එකතුකළ වටිනාකම
3. මූර්ත ජාතික නිෂ්පාදිතය
4. මුළු කෘෂි නිමවුම
5. ශුද්ධ දේශීය නිෂ්පාදිතය

39. නිෂ්පාදන ඉමට ඇතුලත් නොවන ඵලදායී ආර්ථික කටයුත්තක් වන්නේ,
1. ස්ව පරිභෝජනය සඳහා නිෂ්පාදනය කළ භාණ්ඩ
2. තමන්ගේම නිවසින් ලබාදෙන්නා වූ නේවාසික සේවය
3. ස්වේච්ඡා ශ්‍රමය භාවිතයෙන් නිෂ්පාදනය කළ භාණ්ඩ හා සේවා
4. ගෙවීමකින් තොරව නිවස තුළ ඉටුකරනු ලබන ගෘහ සේවය
5. නිෂ්පාදනය කළ සියලුම භාණ්ඩ හා සේවා

40. මෙයින් සමූහ පරිභෝජනය යන්නට ඇතුළත් නොකරන වියදම් වර්ගය වන්නේ,
1. රාජ්‍ය පරිපාලන වියදම්
2. ආරක්ෂණ වියදම්
3. අධ්‍යාපනය සහ සෞඛ්‍ය සඳහා දරන වියදම්
4. පරිසර සංරක්ෂණ වියදම්
5. නීතිය හා සාමය සඳහා දරන වියදම්

41. 2018 මහ බැංකු වාර්තාවට අනුව දළ දේශීය නිෂ්පාදිතයට කෘෂිකර්මාන්ත, කර්මාන්ත, සේවාවන්හි දායකත්වය පිළිවෙලින් දැක්වූ විට නිවැරදි පිළිතුරු වන්නේ,

	කෘෂි කර්මාන්ත	**කර්මාන්ත**	**සේවා**
1.	7.0	26.1	57.7
2.	7.1	26.6	56.7
3.	6.2	56.5	26.6
4.	8.9	26.8	56.4
5.	6.9	26.4	56.8

42. මූලික මිලෙන් නිෂ්පාදකයාට ලබාදුන් සහනාධාර අඩුකොට නිෂ්පාදකයා වෙත සෘජුවම පැවරූ බදු එකතුකළ විට ලැබෙන්නේ,

1. වෙළඳ මිල
2. නිෂ්පාදන මිල
3. ගැණුම් මිල
4. ස්ථාවර මිල
5. සාධක මිල

43. පහත දැක්වෙන්නේ නිෂ්පාදන මූලාශ්‍ර පදනම්කරගෙන එකතුකළ අගය ගණනය කරන ආකාරයට අදාළ දත්ත කිහිපයකි. නිවැරදි ගණනය කිරීමට අනුව එකතුකළ අගය හා අතරමැදි පරිභෝජනය නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,

		රු.මිලියන
නිමැවුම	=	5000
අමුද්‍රව්‍යය	=	2500
සේවා පිරිවැය	=	500

	එකතුකළ අගය	**අතරමැදි පරිභෝජනය**
1.	3000	2000
2.	8000	5000
3.	2000	3000
4.	7000	5000
5.	2000	5000

44. මෙයින් ආයෝජන ආදායම්වල ස්වරූපයක් නොවන්නේ කුමක්ද?

1. පොලිය
2. ලාභාංශ
3. සෘජු විදේශ ආයෝජන නිසා පැන නගින ප්‍රති ආයෝජන ඉපයීම්
4. භූමිය සහ ඛණිජ සම්පත්.
5. ආයෝජන ආදායම් ගෙවීම

45. රාජ්‍ය කටයුතු ඇතුළත් විදේශ වෙළඳාම් අංශවලින් තොර ආර්ථිකයක සමස්ත වියදම් ශ්‍රිතය වන්නේ,

1. $Y = C+G+I+X$
2. $Y = C+I+G+(X-M)$
3. $Y = C+ I+G$
4. $Y = I+G+S+T$
5. $Y = C+I+G+M$

46. පාරිභෝජන වියදම ප්‍රධාන කොටස් තුනකට වෙන්කොට දැක්විය හැකිය. මෙයින් කල් නොපවත්නා පාරිභෝගික භාණ්ඩ මිලදී ගැනීමකට උදාහරණයක් වන්නේ,

1. මෝටර් රථ
2. ඇඳුම් පැලඳුම්
3. ගෘහ උපකරණ
4. අධ්‍යාපනය
5. නිවාස සේවා.

47. ආර්ථිකයක සමාහාර ඉල්ලුමට පහත දැක්වෙන විචල්‍යයන් අතරින් කුමන ඒවා ඇතුළත් වේද?

A	රාජ්‍යය වියදම්	(G)
B	බදු ආදායම	(T)
C	ඉතුරුම්	(S)
D	පරිභෝජනය	(C)
E	අපනයන	(X)
F	ආයෝජන	(I)
G	ක්ෂය වීම්	(D)

1. ABC සහ E 2. ADE සහ C 3. ADE සහ F 4. AEF සහ G 5. GSE සහ G

48. C = 500+0.75y සමීකරණයට අදාළව සමතුලිත ආදායම් මට්ටම වන්නේ,
1. 2000 2. 25000 3. 200 4. 500 5. 375

49. සාර්ව ආර්ථික සමතුලිතයට අදාළව ගිලිහීම් එකතුවීම් නිවැරදිව ඇතුලත් පිළිතුර වන්නේ,
1. C+I+G+(X-M) 2. C+I+G+S+T 3. S+T+G = I+X+M
4. S+T+M = I+G+X 5. C+I+G = S+T+M

50. එක්තරා සරල ආර්ථිකයකට අදාළ ආන්තික පරිභෝජන නැමියාව (MPC) 0.75 ක් වේ. ආයෝජනය (I) මට්ටම රු.බි. 400 ක් යැයිද සිතන්න. මෙම ආර්ථිකයේ සමතුලිත ආදායම් මට්ටම වන්නේ,
1. රුපියල් බිලියන 2000 කි 2. රුපියල් බිලියන 5000 කි
3. රුපියල් බිලියන 1400 කි 4. රුපියල් බිලියන 1600 කි
5. රුපියල් බිලියන 400 කි

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

21	S	II

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

Third Term Test - Grade 12 - 2019

විභාග අංකය .....

ආර්ථික විද්‍යාව II

කාලය පැය තුනයි

❖ **''අ '' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්ද ''ආ'' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

අ උප කොටස

01). i. නිදසුන් සහිතව ආර්ථික සම්පත් හා නොමිල සම්පත් අතර වෙනස දක්වන්න (ලකුණු 4)

ii. සෑම සමාජයක්ම තෝරා ගැනීමේ ගැටලුවකට හා ආවස්ථික පිරිවැයකට මුහුණ දෙන්නේ ඇයි? පැහැදිලි කරන්න. (ලකුණු 4)

iii. ශ්‍රමය හා මානව ප්‍රාග්ධනය අතර වෙනස කුමක්ද? (ලකුණු 4)

iv. නිෂ්පාදන සම්පත් වල හිමිකාරිත්වය හා දේපොළ අයිතිවාසිකම් වල ස්වභාවය යන නිර්නායක මත පදනම්ව ආර්ථික පද්ධති වර්ග කරන්නේ කෙසේද? (ලකුණු 4)

v. ආර්ථික වශයෙන් කාර්යක්ෂම ආර්ථිකයක ප්‍රශස්ත නිෂ්පාදන සංයෝගය නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් භාවිතයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 4)

02). i. පහත සඳහන් දෑ කුමන නිෂ්පාදන සාධක යටතට ඇතුළත් වේද?

(අ) මොරගහකන්ද ජලාශය (ආ) නොනිමි භාණ්ඩ තොගය

(ඇ) සිංහරාජ වනාන්තරය (ඊ) පැය එකක කාලයක් නීති උපදෙස් ලබාදීමක් (ලකුණු 4)

ii. ඉතුරුම් ආයෝජනය හා ප්‍රාග්ධනය යන සංකල්ප හඳුන්වන්න. මේවා අතර ඇති සම්බන්ධතාව පැහැදිලි කරන්න. (ලකුණු 4)

iii. ''ස්වභාවික සම්පත්'' යන්න නිර්වචනය කර එහි ප්‍රභේද උදාහරණ සහිතව දක්වන්න. (ලකුණු 4)

iv. වෙළඳපොල ආර්ථික පද්ධතියක් හා විධානගත ආර්ථික පද්ධතියක් අතර දක්නට ලැබෙන වෙනස්කම් පෙන්වා දෙන්න. (ලකුණු 4)

v. (අ) ප්‍රාග්ධන භාණ්ඩ නිෂ්පාදනය වැඩිකරන විට එහි ආවස්ථික පිරිවැය ක්‍රමයෙන් වැඩිවේ නම් එම ආර්ථිකයේ නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයේ හැඩය පිළිබඳව ඔබට කිව හැක්කේ කුමක්ද? මෙම තොරතුරු රූප සටහනකින් දක්වන්න. (ලකුණු 2)

(ආ) පහත සඳහන් තොරතුරු එම රූපසටහනෙන් පෙන්නුම් කරන්න.

- අත්කර ගත නොහැකි නිෂ්පාදන සංයෝගය (ලකුණු 1)
- ප්‍රාග්ධන භාණ්ඩ නිෂ්පාදන අංශයෙහි හටගත් තාක්ෂණික දියුණුව (ලකුණු 1)

03). i. (අ) පෞද්ගලික ඉල්ලුම හා වෙළඳපල ඉල්ලුම නිර්වචනය කරන්න. (ලකුණු 2)

(ආ) සැපයුම් වක්‍රයක් ව්‍යුත්පන්න කිරීමේදී ස්ථාවරව පවතින සාධක නම් කරන්න. (ලකුණු 4)

ii. ඉල්ලුම වෙනස්වීම හා ඉල්ලුම් ප්‍රමාණය වෙනස්වීම අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 4)

iii. පහළ මිලකට වඩා ඉහළ මිලකදී නිෂ්පාදකයා විසින් සපයනු ලබන ප්‍රමාණ ඉහළ යාමට හේතු පැහැදිලි කරන්න. (ලකුණු 2)

iv. ඉල්ලුම් නීතිය තහවුරු කිරීම සඳහා භාණ්ඩයක මිල වෙනස්වීමක ආදේශන ප්‍රතිවිපාකය හා ආදායම් ප්‍රතිවිපාකය යොදා ගන්නා ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 4)

v. භාණ්ඩයක් සඳහා පවතින මිල ඉල්ලුම් නම්‍යතාව අනම්‍ය වීම සඳහා මිල ඉල්ලුම් නම්‍යතා තීරක හැසිරිය යුතු ආකාර දක්වන්න. (ලකුණු 4)

04). i. ඒකක බදු හා ප්‍රතිශතාත්මක බදු උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 4)

ii. එක්තරා වෙළඳපොලක් සම්බන්ධ වූ ඉල්ලුම් හා සැපයුම් වක්‍ර පහත පරිදි වේ.



දී ඇති ඉල්ලුම් හා සැපයුම් වක්‍ර වලට අනුව ඉල්ලුම් සහ සැපයුම් සමීකරණය ගොඩනගන්න. (ලකුණු 4)

iii. මෙම භාණ්ඩය මත නිෂ්පාදකයා වෙත රු. 10/- ක ඒකක සහනාධාරයක් ලබා දුන්නේ යැයි සිතන්න.

(අ) සහනාධාරයෙන් පසු සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 4)

(ආ) සහනාධාරයෙන් පසු පාරිභෝගික අතිරික්තය හා නිෂ්පාදන අතිරික්තය ගණනය කරන්න. (ලකුණු 2)

iv. ලබාදුන් සහනාධාරය වෙනුවට මෙම භාණ්ඩ මත රු. 15 ක අවම මිලක් පැනවූවහොත්,

(අ) වෙළඳපලෙහි ඇතිවන්නා වූ අධි සැපයුම ගණනය කරන්න. (ලකුණු 2)

(ආ) අවම මිල සාර්ථක කරගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග දක්වන්න. (ලකුණු 2)

(ඉ) අවම මිල අර්ථවත් කරගැනීම සඳහා ඌණ පූර්ණ ගෙවී මික්‍රමය හඳුන්වා දුන් පසු ඇතිවන ශුභ සාධක අහිමි වීම ගණනය කරන්න. (ලකුණු 2)

05). i. අනම්‍ය ඉල්ලුමක් හා නම්‍ය සැපයුමක් පවතින භාණ්ඩයක් මත රු. 5/- ක බද්දක් පැන වූ විට නිෂ්පාදකයා හා පාරිභෝගිකයා අතර බදු බර බෙදී යන ආකාරය රූප සටහනක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 4)

ii. එක්තරා වෙළඳපලක් තුළ මිල යාන්ත්‍රණය මගින් සම්පත් බෙදා හැරීමක් සිදු නොවන විට, හිඟ භාණ්ඩ සලාකයනය සඳහා යොදා ගත හැකි මිල නොවන මාධ්‍යයන් දක්වන්න. (ලකුණු 4)

iii. තරගකාරී වෙළඳපලක් සම්බන්ධව ඉල්ලුම් හා සැපයුම් ස්වභාවය පහත ලේඛනයෙන් විස්තර කෙරේ.

මිල	**ඉල්ලුම් ප්‍රමාණය**	**සැපයුම් ප්‍රමාණය**
20	80	20
40	0	60

මෙම වෙළඳපල මත රු. 3.00 ක ඒකක බද්දක් පැනවූයේයැයි සිතන්න.

(අ) බද්ද නිසා සමතුලිත මිල හා ප්‍රමාණයෙහි සිදුවූ වෙනස සමීකරණ ආශ්‍රයෙන් ගණනය කරන්න.(ලකුණු 4)

(ආ) බද්ද නිසා ආර්ථික අතිරික්තයේ සිදු වූ වෙනස දක්වන්න. (ලකුණු 4)

(ඉ) ඒකක බද්ද නිසා රජයට ලැබෙන බදු ආදායම ගණනය කරන්න. (ලකුණු 2)

(ඊ) බද්දෙන් පසු නිෂ්පාදකයාගේ ආදායමේ වෙනස ගණනය කරන්න. (ලකුණු 2)

ආ උප කොටස

(මෙම කොටසෙන්ද අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න)

06). i. නිෂ්පාදන ආයතනයක කෙටි කාලීන නිෂ්පාදන ක්‍රියාවලියේදී සාමාන්‍ය විචල්‍ය පිරිවැය හා ආන්තික පිරිවැය වක්‍ර ඉංග්‍රිසි U අකුරේ හැඩය ගැනීමට හේතු පැහැදිලි කරන්න. (ලකුණු 4)

ii. ප්‍රමාණික ලාභ වක්‍ර පිරිවැයට අයත් සංරචකයක් ලෙස ආර්ථික විද්‍යාඥයින් විසින් සලකනු ලබන්නේ ඇයි දැයි පෙන්වා දෙන්න. (ලකුණු 4)

iii. වෙළඳපොල ව්‍යුහයන්ගේ ස්වරූප හතර නම්කර එක් එක් වෙළඳපොළ ව්‍යුහයන්ගේ නිෂ්පාදිතයේ ස්වභාවයන් සඳහන් කරන්න. (ලකුණු 6)

iv. පූර්ණ තරගකාරී කර්මාන්තය තුළ කටයුතු කරන නිෂ්පාදන ආයතනයක ඉල්ලුම් වක්‍රයේ පිහිටීම රූප සටහනකින් දක්වා එම හැඩයට හේතුවන සාධක කවරේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 6)

07). i. ''නිෂ්පාදන ආයතනයක ගණනය කරන ගිණුම්කරණ පිරිවැයට වඩා නිෂ්පාදන ක්‍රියාවලියේදී හටගන්නා ආර්ථික පිරිවැය විශාල වේ''. මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟවන්නේද? ඔබේ පිළිතුරට හේතු පැහැදිලි කරන්න. (ලකුණු 4)

ii. නිෂ්පාදන ආයතනයක ස්ථාවර පිරිවැයට අයත් ප්‍රධාන සංරචක නම් කරන්න. (ලකුණු 4)

iii. කෙටි කාලයෙහි නිෂ්පාදනයෙහි නිරතව සිටින පූර්ණ තරගකාරී ආයතනයක් මසකට ඒකකයක වෙළඳපොල මිල රු. 20 ක් යටතේ නිමැවුම් ඒකක 300 ක් අලෙවි කරයි. මෙම ඒකක 300 නිපදවීම සඳහා පහත සඳහන් පිරිවැයක් දරයි.

මුළු ස්ථාවර පිරිවැය	රු. 2400
මුළු විචල්‍ය පිරිවැය	රු. 4200
ආන්තික පිරිවැය	රු. 20

(අ) මෙම ආයතනය මසකට ලබන ලාභය හෝ අලාභය කොපමණද? (ලකුණු 2)

(ආ) මෙවැනි තත්ත්වයක් යටතේ ආයතනය තවදුරටත් නිෂ්පාදනයේ රැඳී සිටීද? ඔබේ පිළිතුරට හේතු පැහැදිලි කරන්න. (ලකුණු 2)

iv. ආයතනයකට, ඒකාධිකාරී කර්මාන්තයට අලුතින් ප්‍රවේශ වීම වළක්වන ස්වභාවික හෝ කෘත්‍රිම බාධක සඳහන් කරන්න. (ලකුණු 4)

v. නිෂ්පාදන සාධකයක, මුළු ඉපැයීම තුළ, වැඩි ප්‍රමාණයක් ආර්ථික බදු කුලී වලින් සමන්විත වන අවස්ථාවක් සුදුසු රූපසටහක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 4)

08). i. ජාතික ගිණුම්කරණ දත්ත ප්‍රයෝජනවත් වන්නේ කෙසේද? (ලකුණු 4)

ii. ආර්ථික ප්‍රදේශයක් තුළ ආර්ථික ක්‍රියාකාරකම්වල යෙදී සිටින නේවාසික ආයතනික ඒකක නම් කරන්න. (ලකුණු 4)

iii. දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේදී සැළකිල්ලට නොගන්නා ඵලදායී ගණුදෙනු දෙකක් හා සැලකිල්ලට නොගන්නා ඵලදායී නොවන ගණුදෙනු දෙකක් ලියා දක්වන්න. (ලකුණු 4)

iv. සාර්ව ආර්ථික සමතුලිතය ඉදිරිපත් කලහැකි ප්‍රවේශ නම් කරන්න. (ලකුණු 3)

v. (අ) ස්වාධීන පාරිභෝජනයක් සහිත පරිභෝජන ශ්‍රිතය ලියා දක්වා එහි සංරචක නම්කරන්න. (ලකුණු 3)

(ආ) ආන්තික පරිභෝජන නැමියාව යනු කුමක්ද? (ලකුණු 2)

09). i. නිෂ්පාදනය හා නිමැවුම යන සංකල්ප කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 2)

ii. දළ එකතුකළ අගය යනු කුමක්දැයි දක්වා නිෂ්පාදන මූලාශ්‍ර ඔස්සේ දළ එකතුකළ අගය ගණනය කරන ආකාරය කල්පිත නිදසුනකින් දක්වන්න. (ලකුණු 5)

iii. පහත සඳහන් තොරතුරු ඇසුරින් කවරක් ආර්ථික නිෂ්පාදන ක්‍රියාකාරකම් තුළට ඇතුළත් කෙරේද, නොකෙරේද යන්න දක්වන්න. (ලකුණු 5)

(අ) ජලාශයක මත්ස්‍යයන් බෝවීම
(ආ) ස්වභාවික වනාන්තරයක ශාක ගහණය වැඩිවීම
(ඉ) පයිනස් වගාවක්
(ඊ) කුඹුරකට හරවා ඇති ජලය
(උ) රක්ෂණ ප්‍රතිපත්තියක් මිල දී ගැනීම

iv. වැයකළ හැකි ආදායම හා පරිභෝජන වියදම අතර සම්බන්ධය රූප සටහනක් ඇසුරින් දක්වන්න.(ලකුණු 3)

v. (අ) වැයකළ හැකි ආදායම හැර පරිභෝජන වියදම කෙරෙහි බලපාන අනිකුත් සාධක 03 ක් දක්වන්න. (ලකුණු 3)

(ආ) C = 200+0.8y යන පරිභෝජන ශ්‍රිතයේ ආදායම් මට්ටම 2500 වන විට පරිභෝජන මට්ටම කොපමණදැයි ගණන් බලන්න. (ලකුණු 2)

10). (අ) දෙන ලද වර්ෂයක් සඳහා ආර්ථිකයක ජාතික ගිණුම් පිළිබඳ කල්පිත දත්ත පහත දැක්වේ. (සියළු සංඛ්‍යා රුපියල් බිලියන වලිනි)

නිෂ්පාදන අංශය	**දළ නිමැවුම් වටිනාකම**	**අතරමැදි පරිභෝජනය**
කෘෂි කාර්මික අංශය	1000	600
කාර්මික අංශය	2000	1200
සේවා අංශය	6000	2200

අමතර තොරතුරු.

- නිෂ්පාදකයින්ගෙන් අයකළ නිෂ්පාදිත මත පනවන ලද බදු	500
- විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම	-420
- නිෂ්පාදකයින්ට ලබාදුන් නිෂ්පාදිතය මත සහනාධාර	200
- විදේශ ශුද්ධ ද්විතීය ආදායම	370
- වෙළඳ ආන්තික හා ප්‍රවාහන ගාස්තු	400
- ආනයන මත පනවන ලද බදු	350
- පාරිභෝගිකයන්ගෙන් අයකළ භාණ්ඩ හා සේවා මත බදු	300
- පාරිභෝගිකයන්ට ලබාදුන් භාණ්ඩ හා සේවා මත සහනාධාර	100
- ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය	550

පහත දෑ ගණනය කරන්න.

i. මූලික මිල අනුව දල එකතුකළ අගය
ii. නිෂ්පාදකයන්ගේ මිල මත දළ එකතු කළ අගය
iii. දළ දේශීය නිෂ්පාදිතය ගැණුම්කරුවන්ගේ මිල මත
iv. ශුද්ධ දේශීය නිෂ්පාදිතය
v. දළ ජාතික ආදායම (ලකුණු 2 x 5)

(ආ) සරල ආර්ථිකයක C= 100+0.9yd හා සහ I = 100 ක් නම්,

i. මෙම ආර්ථිකයේ සමතුළිත නිමැවුම ගණනය කරන්න. (ලකුණු 2)
ii. සමතුළිත නිමැවුමේදී පරිභෝජනය සොයන්න. (ලකුණු 2)
iii. මෙම ආර්ථිකයට රජය මැදිහත් වූ විට රාජ්‍යය වියදම (G = 200) බිලියන 200 ක් නම් නව සමතුළිත ජාතික නිමවුම ගණනය කරන්න. (ලකුණු 3)
iv. C = 100+0.9yd පරිභෝජන ශ්‍රිතයට අදාළව ඉතුරුම් ශ්‍රිතය ගොඩනගන්න. (ලකුණු 3)